DOI : 10.31357/fhssmst.2014.00660

# ප්‍රජා පාදක විශෝධනයෙහි ඵලදායිතාවය

## (ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශය ඇසුරිනි)

විජේසිං විදාන පතිරණගේ නිලන්ති

10 DEC 2014

"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති ක්‍රමය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි"

# පිදුම

මා හදට ලෙව් සුවඳ

තුරුලු කර මෑණියනි

පියාණනි දිරිය පෙව්,

අතවනන බුද්ධියට

දකින්නට ලොවෙහි තතු

කියාදුන්

ඇදුරිඳුනි,

නුඹ සැමට

දෙපා වැද

රන් මලක් වනු

රිසිනි .......

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

අත්සන:- ..................

දිනය:- 2014/11/18........

## උපදේශකවරයාගේ ප්‍රකාශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, 2014.09.22 වන දින පැවති වාචික පරීක්ෂණයේදී පරීක්ෂක මණ්ඩලය විසින් පෙන්වා දුන් සංශෝධනයන් නිවැරදි කර ඇති බවත්, සංශෝධිත නිබන්ධය ශාස්ත්‍රපති උපාධි ප්‍රදානයට ඉතාමත් සුදුසු බවත් නිර්දේශ කරමි.

උපදේශක

මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර | අත්සන | දිනය

............ ............ 2014/11/18

මහාචාර්ය එම්.ඩබ්. ජයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

තෙවන පරිච්ඡේදය

3. විවිධ දඬුවම් ක්‍රම හා විශෝධනයෙහි නෛතික පසුබිම විග්‍රහ කිරීම


3.1 දඬුවම හා එහි ඓතිහාසික පසුබිම 49-56

3.2 අපරාධ පාලනය උදෙසා භාවිතා වන විවිධ දඬුවම් ක්‍රම 56-70

3.3 ප්‍රජා පාදක විශෝධන ක්‍රම 70-79

3.3.1 පරිවාසය (Probation) 80-85

3.3.2 පැරෝලය (Parole) 86-92

3.4 ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක විශෝධන ක්‍රම 93-103

3.5 ප්‍රජා පාදක විශෝධන ආඥාවක් නිකුත් කිරීමේ නෛතික පසුබිම 103-105

3.5.1 පූර්ව දණ්ඩන වාර්තාව 105-108

3.5.2 ප්‍රජා විශෝධන ආඥාවක් යටතේ සිටින වරදකරුවෙකු විසින් පිළිපැදිය යුතු කොන්දේසි 108-111

3.5.3 ප්‍රජා පාදක විශෝධන නියෝග වෙනස් කිරීම 112-113

3.5.4 ප්‍රජා පාදක විශෝධන ආඥාව පැහැර හැරීම සම්බන්ධ විධි විධාන 113-116


සිව්වන පරිච්ඡේදය

4. දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම


4.1 ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක විශෝධන ක්‍රමයෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය 117-130

4.1.1 ව්‍යාපෘති වැඩබිම් ක්‍රියාත්මක වන ආකාරය 130-132

4.1.2 උපදේශන හා ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම 132-133

4.1.3 මත් නිවාරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම 133-137

4.2 අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය 135-157

4.3 ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත අභිමතාර්ථ 157-162

4.4 අභිමතාර්ථ සාධනය කිරීමේ දී බලපානු ලබන අභියෝග 162-173

**පස්වන පරිච්ඡේදය**

**5. නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම**


5.1 නිගමන හා යෝජනා 174-187

5.2 ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය 188-190

5.3 උපග්‍රන්ථ 191-196


**ප්‍රස්ථාර හා සංඛ්‍යා සටහන් නාමාවලිය**

**ප්‍රස්ථාර සටහන් නාමාවලිය** **පිටුව**


**04. පරිච්ඡේදය දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම**

01. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 120

02. 2012 වසරේ දිවයිනේ විවාහක අවිවාහක බව අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 122

03. ජාතිකත්වය අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 127

04. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ජාතිකත්වය අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 143

05. අධ්‍යයන ක්ෂේත්‍රය තුළවිවාහක අවිවාහක බව අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 146


**සංඛ්‍යා සටහන් නාමාවලිය**


01. පරිච්ඡේදය හැඳින්වීම හා ක්‍රමවේදය

01. 20062010 වසර දක්වා ප්‍රජා විශෝධන ආඥා ලැබූ හා ආඥාව කඩ කළ මුළු වරදකරුවන් සංඛ්‍යාව 12

02. පරිච්ඡේදය සාහිත්‍ය විමර්ශනය

02. ශ්‍රී ලංකාවේ රිමාන්ඩ් සිරකරු ජනගහනය 27

03. 19982002 දක්වා වර්ෂවල දඩ මුදල් ගෙවා ගැනීමට නොහැකිව බන්ධනාගාරගත වූ වරදකරුවන් 40

04. පරිච්ඡේදය  දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම

04. 2012 වසරේ අධ්‍යාපන මට්ටම අනුව ප්‍රජා විශෝධන ආඥා
ලැබූ වරදකරුවන් 124

05. 2012 වසරේ වරදේ ස්වභාවය අනුව ප්‍රජා විශෝධන ආඥා ලැබූ
වරදකරුවන් 125

06. 2012 වසරේ නියෝග කළ පැය ගණන අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන් 126

07. දිවයිනේ පළාත් අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන්ගෙන් මත් නිවාරණ ප්‍රතිකාර සඳහා
යොමු කර තිබෙන වරදකරුවන් 134

08. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ වරදේ ස්වභාවය අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන් වරදකරුවන් 144

09. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ වයස අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන් වරදකරුවන් 145

10. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපන මට්ටම අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන් වරදකරුවන් 147

11. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ නියෝග කළ පැය ගණන අනුව ප්‍රජා විශෝධන
ආඥා ලැබූ වරදකරුවන් වරදකරුවන් 150

## ස්තුතිය

- ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදු කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කර මෙම ක්ෂේත්‍රය පිළිබඳ වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම, නිසි මාර්ගෝපදේශකත්වය ලබා දුන් සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර ගුරු පියාණන්ට,
- මෙම පර්යේෂණය සාර්ථකව සිදු කිරිමට අවශ්‍ය පහසුකම් සපයා දුන් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ට,
- සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ සියලුම ගුරු මව් පියවරුන්ට,
- මෙම පර්යේෂණය සිදු කිරීමට අදාල දත්ත ලබා දීමට කටයුතු කළ ප්‍රජා විශෝධන කොමසාරිස්තුමිය ඇතුලු සෙසු නිලධාරීන්ට,
- මෙම පර්යේෂණය සිදු කිරීමේ ආරම්භයේ සිට අවසානය දක්වා උදව් උපකාර කළ වැඩ පරීක්ෂක එන්. පී. පී. සී. නානායක්කාර මහතාට සහ ප්‍රජා විශෝධන නිලධාරී නිශ්ශංක රාජපක්ෂ මහතාට,
- මේ සම්බන්ධයෙන් මා හට නන් අයුරින් උදව් උපකාර කළ සියලු දෙනාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

# නිබන්ධ සාරාංශය

අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති ක්‍රමය විෂය යටතේ ශාස්ත්‍රපති සපර්යේෂණ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණය මඟින් සිදු කරනු ලබන්නේ ප්‍රජා පාදක විශෝධනයෙහි ඵලදායිතාවය සම්බන්ධවයි. පර්යේෂණය සිදු කිරීමෙන් අපේක්ෂිත අරමුණු කිහිපයකි. ඒවා නම් වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමයක් ලෙස ප්‍රජා පාදක විශෝධනයෙහි ඵලදායිතාව හඳුනා ගැනීම, සිර දඬුවමට විකල්පයක් ලෙස ප්‍රජා පාදක විශෝධන ක්‍රමය කෙතරම් සාර්ථකත්වයක් පෙන්නුම් කරන්නේද? යන්නත් සමස්ත ක්‍රියාවලිය සම්බන්ධව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම, ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අභියෝග හඳුනා ගැනීම යන අරමුණු පාදක කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. සිර දඬුවමට විකල්පයක් ලෙස හඳුන්වා දෙන ලද ප්‍රජා පාදක විශෝධන වැඩ සටහන් බොහෝ දුරට අදාළ අභිමතාර්ථ සාධනය කර ගැනීමට සමත් වී තිබේද යන්න පිළිබඳ මෙතෙක් අනාවරණය වී නොමැත. ප්‍රජා පාදක විශෝධනය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ද, විශෝධනයට යොමු කරන ලද පුද්ගලයන් සම්බන්ධයෙන් ද දැනට නිර්ණය කළ හැකි කරුණු අනුව අදාළ ප්‍රජා විශෝධන අභිමතාර්ථ සාධනය කර ගැනීම සම්බන්ධයෙන් ගැටලු පවතින බව පෙනී යයි. එබැවින් පර්යේෂණයක් මඟින් ප්‍රජා විශෝධනය කොතෙක් දුරට සිරගත කිරිමට විකල්පයක් ලෙස සාර්ථකත්වයක් පෙන්නුම් කරන්නේද යන්නත් ඒ තුළ යම් ගැටලු සහගත තත්ත්වයන් පවතී නම් එහිලා බලපා ඇති සාධක හඳුනා ගැනීමත් අපරාධ විද්‍යාත්මක වැදගත් කමකින් යුක්තය.

සරල අහඹු නියදි ක්‍රමය යටතේ මෙම පර්යේෂණයේ නියදි ක්‍රමය තෝරා ගන්නා ලදී. ඒ අනුව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වැඩ බිම් 50 තුළින් ආයතන 30ක් තෝරා ගෙන එම ආයතන ප්‍රධානීන් නියදිය සඳහා තෝරා ගන්නා ලදී. ඔවුන්ගෙන් දත්ත ලබා ගැනීමට සම්මුඛ සාකච්ඡා උප ලේඛනය භාවිත කරන ලදී. මීට අමතරව 2012 වසරේ ප්‍රජා විශෝධන ආඥා ලැබූ වරදකරුවන් 112 දෙනා අතරින් 50 දෙනෙකු ක්‍රමානුකූලව සාදා ගත් ලැයිස්තුවකින් නියදියට අදාළ ඒකක තෝරා ගන්නා ලදී. වරදකරුවන්ගෙන් දත්ත ලබා ගැනිමට ප්‍රශ්නාවලිය උපයෝගී කරගන්නා ලදී.

වැඩි වන බන්ධනාගාර ජනගහනය අඩු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා පාදක විශෝධන ක්‍රමය සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම අපරාධ විද්‍යාත්මක වැදගත් කමකින් යුක්තය. දැනට අප රටේ බන්ධනාගාර තුළට සුළු වරදකරුවන් ඇතුලු කිරීම වළකන අතර බන්ධනාගාර ජනගහනය අඩු කිරීමට සෘජුවම දායක වන මෙම ක්‍රමය සම්බන්ධව පර්යේෂණයක් සිදු කිරීම ඉතා වැදගත් වේ. මෙම ක්ෂේත්‍රයේ වෘත්තීන්හි නිරත වන්නන් හට ද, ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද මෙම ක්‍රමයේ ඵලදායිතාවයෙහි සිදු වන වෙනස්කම් සම්බන්ධව අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ තුළින් ඔවුන්ට ප්‍රජා පාදක විශෝධන ක්‍රමයෙහි ඵලදායිතාවය අඩු වී තිබෙන බව තහවුරු වේ නම් ඊට බලපා තිබෙන හේතු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට මේ තුළින් හැකියාව උදා වේ.

# පළමු පරිච්ඡේදය

## 1. හැඳින්වීම හා ක්‍රමවේදය

### 1.1. හැඳින්වීම.

වර්තමාන ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ජනගහනයේ වැඩිවීමක් දක්නට ලැබේ. මේ තුළ වරදකරුවන් වූ සිරකරුවන් හා වරදකරුවන් නොවූ රිමාන්ඩ් සිරකරුවන් යන දෙකොටස දක්නට ලැබේ. සිරකරුවන් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් මෙරට ඉදි වී තිබෙන බන්ධනාගාරවල තදබදයක් දක්නට ලැබේ. මේ හේතුකොට ගෙන සිරකරුවන්ගේ මූලික අවශ්‍යතා අවම මට්ටමෙන් සපුරාලීමට පවා රජය අසීරුතාවයකට පත් වී සිටී. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන වලට අනුව 2010 වර්ෂය වන විට බන්ධනාගාරගත සිරකරුවන්ගේ ප්‍රමාණය 32128කි. මෙය 2012 වසරේ දී 27000 කට ආසන්න වන බව පෙන්වා දිය හැකිය. එමගින් 2010 වර්ෂයට සාපේක්ෂව 2012 වසරේ දී බන්ධනාගාර ජනගහනයේ අඩු වීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් මෙම සිරකරුවන්ගෙන් එක් අයෙකු නඩත්තු කිරීම සඳහා දිනකට රු: 372 ක මුදලක් රජයට දැරීමට සිදු වී තිබේ. මෙය රාජ්‍ය ආදායමෙන් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වේ.

දැනට බන්ධනාගාර තුළ සිදු කරනු ලබන පුනරුත්ථාපන වැඩ සටහනක් ලෙස වෘත්තීය පුහුණු කිරීමේ වැඩ සටහන් හඳුන්වා දිය හැකිය. මේ සඳහා සිරකරුවන් යොමු කිරීම බන්ධනාගාර තුළ රඳවා සිටින කාලයට පමණක් සීමා වේ. ඔවුන් නිදහස් වී සමාජයට පැමිණි පසු එකී වෘත්තීන්හි නිරත වනු දක්නට නොලැබේ. බොහෝ විට වෙනත් අපරාධයක් නැවත කර ඔවුන් බන්ධනාගාරගත වීම දක්නට ලැබේ. මෙකී කාරණා හේතු කොටගෙන වරදකරුවන් බන්ධනාගාර ගත කිරීමට විකල්පයක් වශයෙන් ප්‍රජා පාදක විශෝධන ක්‍රම මඟින් වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ.

අපරාධ යුක්ති ක්‍රමය තුළ දණ්ඩනය, දණ්ඩනවේදය, දාණ්ඩනික යන වචන යල් පැනගොස් ඇත. ඒ වෙනුවට බොහෝ පිරිස විශෝධනය යන වචනය භාවිතා කරනු ලැබේ. "විශෝධනය" තුළ දී වරදකරුවන් පුනරුත්ථාපනය කරන බවක් ද කිය වේ. එනිසා පුනරුත්ථාපනයකින් තොර දඬුවම් මඟින් වේදනා ලබා දීම පමණක්ම විශෝධනය යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රජා විශෝධන ක්‍රම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වැඩිවන බන්ධනාගාර ජනගහනය පාලනය කිරීමේ අරමුණින් බන්ධනාගාරයට පිටතින් වරදකරුවන්

පුනරුත්ථාපනය කරන, සේවා සපයන වැඩසටහන් අන්තර්ගත ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත හැකිය. සමාජයේ විවිධ කොටස් මෙය විවිධාකාරයෙන් හඳුනා ගෙන තිබෙන හෙයින් මෙයට නිශ්චිත නිර්වචන දීම පහසු නැත.

"විශෝධනය" යන්නෙන් කුමක් අදහස් වේද? යන්න පිළිබඳව අපගේ අවධානය යොමු කිරීමේ දී එය මෙලෙස හඳුනාගත හැකිය. වැඩ සටහන්, සේවා පහසුකම් විශේෂයෙන්ම චෝදනා ලැබූ, වරදකරු වූ හෝ සාපරාධී වැරදි වලට හෝ නීති උල්ලංඝණය සම්බන්ධ හෝ විනිශ්චයට භාජනය වූ වැඩිහිටියන්, බාල වරදකරුවන් යන දෙකොටස කළමනාකරණය සඳහා වගකිව යුතුව කටයුතු කරන සංවිධානවල එකතුවක් ලෙස විශෝධනය යන්න හැඳින්විය හැකිය.

ප්‍රජා විශෝධනය ලෙස නගරයක්, පළාතක්, ප්‍රාන්තයක් හෝ මධ්‍යම රජයක් මඟින් වරදකරුවන් වූ අපරාධකරුවන් අධීක්ෂණය කරනු ලබන්නා වූ ඕනෑම ප්‍රජා පාදක වැඩ සටහනක් හැඳින්විය හැකිය. එම වැඩ සටහන විවිධ සේවාවන් වරදකරුට සපයයි. එය දඬුවම් පැමිණවීමේ කොන්දේසි වලට අනුව වරදකරුවන්ගේ චර්යාව අධීක්ෂණය හා වැඩිදියුණු කරයි. එසේම වරදකරුවන්ට දඩ මුදල් ගෙවීමට, අපරාධයට ගොදුරු වූ තැනැත්තාට වන්දි ගෙවීමට, ප්‍රජා සේවය හා ප්‍රතිෂ්ඨාපනයට තිබෙන වගකීම වැඩි කරයි. මෙම ප්‍රජා පාදක විශෝධන ක්‍රමයේ මූලික අරමුණ පරිවාස නියෝග, ලයිසන් ක්‍රමය ( බලපත්‍ර මත මුදා හැරීම ) හා ප්‍රජා සේවා පනත මඟින් මුදා හරින වරදකරුවන්ට නැවත සමාජයට ඒකාබද්ධ වීමට උපකාර වීමයි.

1960 ගණන් වලින් පසුව ප්‍රජා පාදක විශෝධන ක්‍රමය පිළිබඳව ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වී ඇත. ස්වීඩනය, ඇමරිකා එක්සත් ජනපදය, එංගලන්තය, කැනඩාව, ඩෙන්මාර්කය, බෙල්ජියම ඇතුළු බොහෝ රටවල අපරාධකරුවන් නැවත සමාජයට සම්බන්ධ කිරීමේ ක්‍රමයක් වශයෙන් ප්‍රජා පාදක විශෝධන ක්‍රම හඳුන්වා දී තිබේ. ස්මයික්ලා (1981) නිර්වචනය කරන පරිදි පුනරුත්ථාපනය වන්නන්ගේ සහයෝගය සඳහා වැඩ සටහන් කොතරම් දුරට ප්‍රජාව තුළ නිත්‍යානුකූලව කටයුතුවල නියැලී ඇත් ද එතරම් දුරට එම වැඩ සටහන් ප්‍රජා පාදක යැයි සලකනු ලැබේ. (ජයසුන්දර, 1993, 85)

සිර දඬුවමට විකල්පයක් ලෙස වඩාත් තාර්කික හා යථාර්තවාදී එළඹුමක් ලෙස ප්‍රජා පාදක විශෝධන ක්‍රමය වැදගත් වීමට බලපාන කරුණු කිහිපයක් හඳුනාගත හැකිය.

- වඩාත් මානුෂීය ගුණයකින් යුක්ත වීම.

- වරදකරුවන් සමාජයට නීතිගරුක පුද්ගලයින් වශයෙන් සම්බන්ධ කිරීමට ඇති හැකියාව.
- වරදකරුවන් පරිපාලනය සඳහා යන වියදම අවම වීම. (ජයසුන්දර, 1993, 85)

ප්‍රජා පාදක විශෝධන ක්‍රමයන් තුළ දී වරදකරු සිරගත කිරීමක් සිදු නොකරන අතර නිවස තුළ, ප්‍රජාව තුළ රැඳවීමට කටයුතු කරයි. දැඩි දඬුවම් පැමිණ වීමේ ක්‍රම පිළිබඳ මේ තුළින් අවධානය යොමු නොකරයි. වරදකරු සිරකර තිබෙන වරද වෙනුවට ප්‍රජා වැඩට යොමු කිරීම, අධීක්ෂණය කිරීම ආදිය සිදු කරන බැවින් මෙය වඩාත් මානුෂීය ගුණයකින් යුක්ත වේ. ප්‍රජා පාදක විශෝධන ක්‍රම තුළ උපදේශනය හා අධීක්ෂණය ක්‍රියාත්මක වන බැවින් වරදකරු සමාජයට නීතිගරුක පුද්ගලයින් වශයෙන් සම්බන්ධ කිරීමේ හැකියාව ඇත. වරදකරු නිවස තුළ රඳවන බැවින් හා ඔහුට රැකියාවක් කිරීමට අවස්ථාවක් ලැබෙන බැවින් රජයට යන පරිපාලන වියදම අවම කර ගත හැකිය.

ප්‍රජා විශෝධන වැඩ සටහන් වන පැරෝලය, පරිවාසය ඇතුලු අනෙකුත් වැඩසටහන් මඟින් අවධානය යොමු කර ඇත්තේ වරදකරුවන් අදාළ කොන්දේසි වලට යටත්ව කටයුතු කිරීමටයි. ප්‍රජා පාදක විශෝධන ක්‍රම අතර වරදකරුවන් අපරාධ යුක්ති ක්‍රමයෙන් වෙනත් මඟකට යොමු කිරීම (Diversion), වරදකරුවන් පොලීසිය, අධිකරණය වැනි ආයතන සමඟ කටයුතු කිරීමේ දී අවශ්‍ය උපදෙස් ලබා දීම (Advocacy), අරමුණු කරගෙන ක්‍රියාත්මක වූ වැඩ සටහන් හා වරදකරුවන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීමට (Reintegration) ක්‍රියාත්මක වන වැඩ සටහන් දක්නට ලැබේ. (ජයසුන්දර, 1993, 85)

මෙකී අරමුණු මූලික කරගෙන ක්‍රියාත්මක වන වැඩසටහනක් ලෙස පැරෝල් (Parole) ක්‍රමය හඳුන්වා දිය හැකිය. බන්ධනාගාරය තුළ සිර දඬුවමෙන් නිශ්චිත කාලයක් ගෙවුනු පසු ඔහු කොන්දේසි යටතේ නිදහස් කිරීම මෙමඟින් සිදු වේ. පැරෝල් ක්‍රමයේ ඉතිහාසය දෙස විමසා බැලීමේ දී මෙයට සමාන ක්‍රම ස්පාඤ්ඤය, ප්‍රංශය, එංගලන්තය වැනි රටවල පැවතුන බව පොදුවේ පිළිගනී. අපරාධකරුවන්ට දඬුවමක් වශයෙන් පිටුවහල් කිරීමට පහසුකම් නැති වී යාම නිසා බන්ධනාගාරවල වැඩිවන ජනගහනය අඩු කිරීමේ ක්‍රමයක් වශයෙන් එංගලන්තය පැරෝල් ක්‍රමය හඳුන්වා දී ඇත. එංගලන්තය ඕස්ට්‍රේලියාවට පිටුවහල් කළ අපරාධකරුවන්ගෙන් බලාපොරොත්තු වූ ගොවිතැන් කටයුතු වල නිරත වීම, ගොඩනැගිලි

ඉදිකරන්නන් ලෙස කටයුතු කිරීම ආදිය ඉටු නොවුනු හෙයින් එම අපරාධකරුවන් රඳවා තැබීමට එංගලන්තය බන්ධනාගාර ඇති කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඕස්ට්‍රේලියාවේ Norfolk ප්‍රදේශයේ හා Vandiemens Land ප්‍රදේශයේ සිර ගෙවල් ඉදි කරන ලදී. 1837 1860 දක්වා කාලය තුළ දණ්ඩනවේදය හා බන්ධනාගාර පිළිවෙත් පිළිබඳ වෙනස්කම් කිහිපයක් ඇති කළ යුතු බවට අදහස් අත්හදා බැලීම සිදු කළ පුද්ගලයන් දෙදෙනෙක් හමුවේ. එනම් කැප්ටන් ඇලෙක්සැන්ඩර් මැකොන්චි (Alexander Maconchi) හා සර් වෝල්ටර් ක්‍රොෆ්ටන් (Walter Crofton)ය. මැකොන්චි පැරෝල් ක්‍රමයේ පියා ලෙස හඳුන්වයි. ඔහු විසින් 1840 දී එංගලන්තයෙන් පැරෝල් ක්‍රමය ආරම්භ කරයි. (රත්නපාල, 1999, 150)

ශ්‍රී ලංකාවේ බලපත්‍ර ක්‍රමය පැරෝල් ක්‍රමයට බොහෝ දුරට සමාන ක්‍රමයක් ලෙස හඳුනා ගත හැකිය. ලංකාවේ අපරාධ වැළැක්වීමේ ආඥා පනත යටතේ 11 වැනි ඡේදයට අනුව අධිකරණ ඇමතිවරයා යටතේ බලපත්‍ර මත මුදා හැරීමට හැකියාව ඇත. වසර 02 කට අඩු සිර දඬුවමක් නියම වූවන් මේ යටතේ නිදහස් කිරීමට තෝරා ගනී. තෝරාගත් පුද්ගලයන් පිළිබඳ සමාජ වාර්තා සියුම්ව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව බලපත්‍ර මණ්ඩලය මත නිදහස් කිරීම නිර්දේශ කරනු ලැබේ. නිදහස් කිරීමෙන් පසුව බලපත්‍ර මත නිදහස් කිරීමට අදාළ කොන්දේසි උල්ලංඝණය කළහොත් බලපත්‍රය අවලංගු කර නැවත සිර දඬුවම් ලබා දෙනු ලැබේ. (ජයසුන්දර, 1993, 86)

පරිවාස ක්‍රමය ද වරදකරුවන්ට සිර දඬුවම් ලබා දෙනවා වෙනුවට ඔවුන් අධීක්ෂණය යටතේ නිදහස් කිරීම අරමුණු කරගෙන ගොඩනැගුණකි. මෙය පැහැදිලි ලෙසම අද පවතින තත්ත්වයට වර්ධනය වූයේ ඇමරිකාවේ ක්‍රියාත්මක වූ වැඩ සටහන් තුළිනි. කොන්දේසි වලට යටත්ව වරදකරුවන් සමාජය තුළ තැබීමට උත්සාහ කිරීම පරිවාස නියෝග යටතේ සිදු වේ. පරිවාසය තුළ දී වරදකරුවන්ට ඔහුගේ සමාජ සම්බන්ධතා නැති කර ගැනීමට අවශ්‍ය නොවන අතර තමා වෙත එන අධීක්ෂණය පිළිගනිමින් නිදහසේ ජීවත් වීමට හැකියාව ඇත. මෙහිදී අපරාධයක් සිදුකර වරදකරු වූ සමාජ පරිසරය තුළම තමන්ට මුහුණ දීමට සිදුවන අර්බුද හා ගැටලුවලට මුහුණ දෙන ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙනු ලැබේ. (රත්නපාල, 1999, 192)

1970 දී පරිවාසය ගැන මෙසේ සඳහන් කොට ඇත. "පරිවාසය ඊට යෝග්‍ය අය සඳහා යොදා ගත හැකි උපක්‍රමයකි. මන්ද එය වැරදි කළ අය ඵලදායි ලෙස පුනරුත්ථාපනය කිරීමට මඟ සලසයි. එසේ කරන්නේ ඒ තැනැත්තා හා ප්‍රජාව අතර පවත්නා සම්බන්ධතා අඛණ්ඩව පවත්වා ගෙන යෑමෙනි. සියයට සියයක් ඵලදායි නොවන කෙනෙකු එතනම පල් වෙන්නට තුඩු දෙන හිරකර තැබීම වැන්නකින් මතු වන අනිෂ්ට ප්‍රතිඵල පරිවාසය මඟින් ක්‍රමවත්ව මඟ හරිනු ලැබේ. එසේ හිරකර තැබීම වැරදි කළ තැනැත්තා යළිත් ප්‍රජාව සමඟ එකතු කිරීම (පිරිද්දීම) කළ නොහැකි තත්ත්වයට පත් කරන හා එය අනවශ්‍ය ලෙස සංකීර්ණ කරන මාර්ගයකි." (රත්නපාල, 1999, 193)

මීට අමතරව ප්‍රජාව මුල්කර ගත් අපරාධ නිවාරණ ක්‍රම කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය. අතරමඟ නිවාස ක්‍රමය (Half way – in –houses), අධ්‍යාපනය මුල්කර ගෙන නිදහස ලබා දෙන ව්‍යාපෘතිය (Education Release), වැඩ සඳහා මුදා හැරීම (Work Release), නිවාඩු නිදහස (Furlough) ආදී ක්‍රම හඳුන්වා දිය හැකිය. බ්‍රිතාන්‍ය විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රජා සේවා නියෝග (Community Service Orders) ප්‍රජාව පාදක කරගත් අපරාධ නිවාරණ ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම ප්‍රජා සේවා නියෝග තුළ පුනරුත්ථාපන මූලිකාංගයන් ගැබ්වන අතර මේ යටතේ නියෝග ලැබූ ආඥාලාභීන් මහලු මඩම්, අනාථ ළමා නිවාස, පාසල්, පන්සල්, පල්ලි වැනි පොදු ආයතන වලට යොමු කරමින් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ තම සේවය සැලසීමට නියෝග කරනු ලැබේ. (රත්නපාල, 2007, 452453)

බ්‍රිතාන්‍ය, ඇමරිකාව, ඕස්ට්‍රේලියාව ආදී රටවල පමණක් නොව ලොව විවිධ මානව සමාජ කරා ඉහත සඳහන් ප්‍රජා පාදක විශෝධන ක්‍රම වර්තමානය වන විට ව්‍යාප්ත වී ඇත. එකී සමාජයන් පුද්ගලයන්ගේ සමාජ විරෝධී චර්යාවන් පාලනය කිරීමට මෙකී ක්‍රම ඔස්සේ ක්‍රියාකර තිබේ.

ශ්‍රී ලංකාව තුළ විධිමත් ලෙස ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ආරම්භ වීමට පෙර ප්‍රජාව පාදක කොට ගෙන වරදකරුවන් පුනරුත්ථාපනය කර තිබෙන බවට ඉතිහාසය සාක්ෂි දරයි. එය පණ්ඩුකාභය රජ දවස තෙක් දිව යයි. මෙහිදී ශාරීරිකව දැඩි දඬුවම් නොදී මානසිකව එය වරදකරුට දැන්වීමට කටයුතු කර තිබේ. එනම් එකල ක්‍රියාත්මක වූ ගම්සභා ක්‍රමය තුළින් මෙය මනාව පැහැදිලි කරගත හැකිය. නීතිගරුක නොවන ගම් වැසියන්ට ඔවුන්ගේ සාමාන්‍ය ජීවන